# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2113/39 - 2019 මාර්තු මස 06 වැනි බදාදා - 2019.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ගිරිබාව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1)(අ) වගන්තිය යටතේ ගිරිබාව ප්‍රාදේශීය සභාවේ අංක 2 - පැරකුම්පුර කොට්ඨාසයට තේරී පත්වූ විජේනක මොහොට්ටි මුදියන්සේලාගේ නයනානන්ද විජේනක අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ගිරිබාව ප්‍රාදේශීය සභාවේ අංක 2 - පැරකුම්පුර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අධිකාරි මුදියන්සේලාගේ ආරියරත්න නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ගිරිබාව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, ගමලත්ගේ දිලිප් නිශාන්ත වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අධිකාරි මුදියන්සේලාගේ ආරියරත්න, ගිරිබාව ප්‍රාදේශීය සභාවේ අංක 2 - පැරකුම්පුර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ගමලත්ගේ දිලිප් නිශාන්ත,
තේරීම්භාර නිලධාරී,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 05 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

03 - 972

1A - G 29587 — 27 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*